# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/4/01/2017 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.07. 23 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්/ 08 )2018

දකුණු පළාත් සභාවේ සියළුම,

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,

ගණන් දීමේ නිලධාරීන්,

පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

ව්‍යවස්ථාපිත අධිකාරී වල ප්‍රධානීන්.

**<u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම සඳහා සකස් කර ඇති පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය වෙත තොරතුරු කැඳවීම - 2017 මුදල් වර්ෂය</u>**

උක්ත වැඩසටහන පිළිබඳව පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ලේකම්ගේ අංක රා.ගි.කා.ස./පොදු/8/1/2017 හා 2018.07.20 දිනැති ලිපිය හා බැඳේ. (අදාළ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

එම ලිපියෙන් පෙන්වා දී ඇති පරිදි 2017 මුදල් වර්ෂයට අදාළ දත්ත පදනම් කරගෙන දියත් කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දීප ව්‍යාප්ත ඇගයීම් වැඩසටහන මේ වන විට ආරම්භ කර ඇත.

මෙම ඇගයීම් වැඩසටහන සඳහා යොදාගත යුත්තේ 2017 මුදල් වර්ෂයට අදාළ දත්ත හා කාර්ය සාධනය වේ.(2017 වසර සඳහා වන ගිණුම් වාර්තා සහ අනෙකුත් වාර්තා ඊළඟ වසරේ නියමිත දිනයන්හි ඉදිරිපත් කිරීමද ඇතුළත්ව)

ඇගයීම් වැඩසටහන සඳහා දත්ත ඇතුළත් කිරීමේදී එක් එක් ආයතන විසින් එම ලිපියේ අංක 4 ඡේදයේ දක්වා ඇති කාල සටහන අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

එමෙන්ම එකී ලිපියේ 3 වන ඡේදයේ සඳහන් පරිදි පළාත් සභා විසින් අනුමත වැය ශීර්ෂයක් පවතින සියළු ආයතන, පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් මඟින් පිහිටුවා ඇති ආයතන හා සියළුම පළාත් පාලන ආයතන මෙම වැඩසටහනට දත්ත ඇතුළත් කිරීමට වග බලා ගත යුතු බවද අවධාරණය කරමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

**2017 දත්ත පදනම් කරගත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා මෙම වසර අවසානයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීමට නියමිත බැවින්, කාලසටහනෙහි දක්වා ඇති පරිදි දත්ත ඇතුළත් කිරීමට පරිඝණක තොරතුරු පද්ධතිය විවෘත කළ වහාම එමගින් ඉල්ලා ඇති තොරතුරු නිවැරදිව හා කඩිනමින් ලබාදීම ප්‍රධාන ගණන් දීමේ/ගණන් දීමේ නිලධාරීන් හා ආයතන ප්‍රධානීන් වශයෙන් ඔබගේ වගකීම බවද සඳහන් කරමි.**

මෙය හදිසි හා අත්‍යාවශ්‍ය රාජකාරියක් සේ සළකා ප්‍රමුඛතාවය දී කටයුතු කර නියමිත දිනට ප්‍රථම පරිඝණක තොරතුරු පද්ධතිය මගින් ඉල්ලා ඇති තොරතුරු කඩිනමින් ලබා දී පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේ 2017 වසර සඳහා වන මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම් වැඩසටහන වඩා සාර්ථක කර ගැනීමට දායක වන ලෙස වැඩිදුරටත් දන්වමි.

මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩිදුර උපදෙස් මේ සමඟ අමුණා ඇති ලිපියෙහි සඳහන් දුරකථන අංක මඟින් අදාළ නිලධාරීන් අමතා ලබාගන්නා ලෙසද දැනුම් දෙමි.

**එමෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් එහි අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම වාර්ෂිකව සිදුවන බැවින් ඔබගේ ආයතන වල ක්‍රියාකාරීත්වයේ පවතින අඩුපාඩු දුර්වලතා මගහරවාගෙන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු කර ඉහල ඇගයීම් ප්‍රතිඵල අත්කර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.**

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

**පිටපත්:-**

01. ලේකම්, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව - දැ.ගැ.ස.
02. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස
03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පලාත - අ.ක.ස.
04. ප්‍රධාන ගණකාධිකාරී,ප්‍රධාන ලේකම් කාර්යාලය - සම්බන්ධීකරණ කටයුතු සඳහා

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
இலங்கை பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே
Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte

# රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
# அரசாங்கக் கணக்குக் குழு
# COMMITTEE ON PUBLIC ACCOUNTS

දුරකථන / தொலைபேசி / Telephones: 2777301, 2777382, 2777100 (General) Ext. 5240, 5249
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / e-mail: pac@parliament.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2777559, 2777602

මගේ අංකය : ර.ගි.කා.ස. / පොදු /8/1/2017

2018.07.20

ජනාධිපති ලේකම්

අග්‍රාමාත්‍ය ලේකම්

අමාත්‍ය මණ්ඩල ලේකම්

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / විශේෂිත වියදම් ඒකක ප්‍රධානීන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් / පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා දෙපාර්තමේන්තු ප්‍රධානීන් / පළාත් සභා අධිකාරී හා මණ්ඩල ප්‍රධානීන්/ පළාත් පාලන කොමසාරිස්වරුන් / පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් සහ පළාත් පාලන ආයතන ප්‍රධානීන්

<u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම සඳහා සකස් කර ඇති පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය වෙත තොරතුරු කැඳවීම - 2017 මුදල් වර්ෂය</u>

උක්ත වැඩසටහන සම්බන්ධව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද 2017.01.23 දිනැති හා 2017.06.20 දිනැති උපදෙස් මාලාවන්ට අවධාරණය කරමි.

2017 මුදල් වර්ෂයට අදාල දත්ත පදනම් කරගෙන දියත් කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දීප ව්‍යාප්ත ඇගයීම් වැඩ සටහන මේ වනවිට ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති අතර, ඒ සඳහා මෙහි 4 වැනි ඡේදයේ දක්වා ඇති කාලසටහන අනුව කටයුතු කළ යුතු බවට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් දෙන ලද නියෝග මත මෙම උපදෙස් මාලාව නිකුත් කෙරේ.

02. <u>ඇගයීම් සඳහා යොදාගනු ලබන කාල පරිච්ඡේදය</u>

මෙම ඇගයීම් වැඩසටහන සඳහා යොදාගත යුත්තේ 2017 මුදල් වර්ෂයට අදාල දත්ත හා කාර්ය සාධනය වේ. (2017 වසර සඳහා වන ගිණුම් වාර්තා හා අනෙකුත් වාර්තා ඊළඟ වසරේ නියමිත දිනයන්හි ඉදිරිපත්කිරීමද ඇතුලත්ව)

03. <u>ආවරණය කරනු ලබන ආයතන</u>

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් වැය ශීර්ෂයන් සම්මත කරනු ලබන සියලුම ආයතන ද, පළාත් සභා විසින් අනුමත වැය ශීර්ෂයක් පවතින සියලු ආයතන ද, , පළාත් සභාවක් විසින් ප්‍රඥප්තියක් මගින් පිහිටුවා ඇති ආයතන ද, සියලුම පළාත් පාලන ආයතන ද මෙම වැඩසටහනට ඇතුළත් වේ. පළාත් සභාවක දෙපාර්තමේන්තුවක්, කාර්යාංශයක් හෝ වෙනත් එවැනි නමකින් ක්‍රියාත්මකව පැවතිය ද, වැය ශීර්ෂයක් වෙන් කොට නොමැති හෝ ප්‍රඥප්තියක් මගින් වෙනම ගිණුම් ඒකකයක් ලෙස අධිකාරී බලයක් ලබා දී නොමැති ආයතන මෙම ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නොවේ.

04. එක් එක් ආයතන විසින් තම දත්ත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු දින

| ආයතන වර්ගය | දත්ත ඇතුළත් කිරීමට තොරතුරු පද්ධතිය විවෘත කරනු ලබන දිනය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා මඟින් විගණකාධිපති වෙත දත්ත ඉදිරිපත් කළ යුතු අවසන් දිනය |
|---|---|---|
| රජයේ අමාත්‍යාංශ, විශේෂිත වියදම් ඒකක, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 2018 ජුලි 16 | 2018 අගෝස්තු 15 |
| පළාත් සභා (පළාත් සභා අරමුදල්) | 2018 ජුලි 16 | 2018 අගෝස්තු 31 |
| පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂිත වියදම් ඒකක | 2018 ජුලි 16 | 2018 අගෝස්තු 31 |
| පළාත් සභා ප්‍රඥප්ති මඟින් පිහිටුවා ඇති ආයතන | 2018 ජුලි 16 | 2018 අගෝස්තු 31 |
| සියලු පළාත් පාලන ආයතන | 2018 ජුලි 16 | 2018 අගෝස්තු 31 |

05. 2015 දත්ත පදනම් කරගත් ඇගයුම් පිළිබඳ වාර්තාව 2017 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර, 2016 වර්ෂය සඳහා වන වාර්තාව 2018 ජුනි 19 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. මේ අනුව 2017 දත්ත පදනම් කරගත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා මෙම වසර අවසානයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

2015 මුදල් වර්ෂය සඳහා වූ ඇගයුම් ප්‍රතිඵල අනුව, එක් එක් කාණ්ඩයේ ආයතන සඳහා සාධාරණ නියෝජනයක් ලැබෙන පරිදි තෝරාගත් ආයතන 100ක් සඳහා සම්මාන පිරිනැමීම 2017 නොවැම්බර් 13 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පවත්වන ලද අතර, 2016 මුදල් වර්ෂය සඳහා වූ එසේ තෝරාගත් ආයතන සඳහා සම්මාන පිරිනැමීම ඉදිරි කාලයේදී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

06 ( අ). එක් එක් ආයතන සඳහා අවශ්‍ය කෙරෙන අන්තර්ජාල ලිපිනයන්, මුර පද හා රහස් සංකේත වෙන් කිරීම.

2017 මුදල් වර්ෂය පදනම් කර ගත් ඇගයීම සඳහා ද 2016 සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන්කර දෙන ලද අන්තර්ජාල ලිපිනයන්, මුර පද හා රහස් සංකේත භාවිතා කළ යුතුවේ. යම් ආයතනයක මෙම කාර්යයට බලය පැවරූ නිලධාරියාගේ හා/හෝ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වෙනස් වීමක් සිදුව ඇත්නම් හෝ 2016 වසර සඳහා මෙම උපදෙස් ලිපියේ අංක 2 අනුව ආවරණය විය යුතු අලුතින් ඇතිවූ යම් ආයතනයක් ඇත්නම් ඒ සඳහා අවශ්‍ය නව අන්තර්ජාල ලිපිනයන්, මුර පද

හා රහස් සංකේත වෙන්කර ගැනීම 2017.06.02 දිනැති මගේ අංකය : ර.ගි.කා.ස. / පොදු /ප්‍ර/8/1/2017 ලිපියෙන් දක්වා ඇති උපදෙස් පරිදි නොපමාව කර ගත යුතුවේ.

06 (ආ). මෙම ක්‍රියාවලිය සඳහා වන පොදු උපදෙස් හා නිරන්තරයෙන් විමසා සිටින කරුණු පිළිබඳ පැහැදිලි කරගැනීම සඳහා පහත සඳහන් නිලධාරින් ඇමතීමෙන් ලබාගත හැකි වේ.

| | |
|---|---|
| ප්‍රශ්නාවලිය සම්බන්ධිත ගැටළු | - බුද්ධිකා අබේසිංහ මිය දු.අංක: 0112777100 – 5269 |
| | - සුදීපා නිර්මාණී මෙය දු.අංක: 0112777100 – 5242 |
| තාක්ෂණික ගැටළු | - චමින්ද විල්ලෝරාරච්චි මයා දු.අංක: 0112777517 |
| | - මෙනුෂි චන්දිමා මෙය දු.අංක: 0112777100 – 6603 |

2015 සහ 2016 ඇගයුම් ක්‍රියාවලිය සාර්ථක අන්දමින් නිමකර ගැනීමට ඔබ සැමගෙන් ලද සහාය පිළිබඳ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාගේ විශේෂ ස්තුතිය සඳහන් කර සිටින ලෙස මවෙත උපදෙස් ලැබී ඇති අතර 2017 වසර සඳහා වන ඇගයීම් වැඩසටහනටද එලෙසම ප්‍රතිචාර දක්වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

Wijayapme

ලේකම්,
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව.